මගේ අංකය - ඩී5/විභාග/ සැරයන්/2016
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016.04. 11

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

## <u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරට උසස් කිරීමේ ලිඛිත විභාගය 2016</u>

මෙම දෙපාර්තමේන්තුවේ පවතින බන්ධනාගාර සැරයන් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2016/03/31 දිනට පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි නියාමක නිලධාරීන් සහ කාන්තා නියාමක නිලධාරිණීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 1/3 ක් මෙමගින් සම්පූර්ණ කරනු ලබන අතර, ඒ අනුව පිරිමි තනතුරු 60ක් හා කාන්තා තනතුරු 02ක් බඳවා ගැනීමට නියමිතය.

02. මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව 2016.05.10 දිනට ප්‍රථම මා වෙත එවිය යුතුය. අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම් කරුවන්ගේ සහ ප්‍රමාද වී අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම් කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මේ බව නිලධාරීන්ට දන්වා අවශ්‍ය කටයුතු කරන්න.

I **වැටුප් ක්‍රමය** - 32010 - 9×370 - 17×495 - 43755 - RS-2 – 2016

I. කාර්යක්ෂමතා කඩඉම් - සැරයන් තනතුරට පත්ව වසර 03ක් ඇතුළත සමත් විය යුතුය.

II **සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
III. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (08) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

III **සතුටුදායක සේවා කාලයක් යනු :** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි XVII වැනි පරිච්ඡේදයේ 186(I) වගන්තිය අනුව රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද ,සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද , සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද . එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි XVII වැනි පරිච්ඡේදයේ 186(II) වගන්තිය අනුව නිලධරයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට,නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක්ද, සහ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදි බැහැර කළ යුතු වන්නේය.

IV **උසස් කිරීමේ ක්‍රමය :** විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් විභාගයේදී ඉහළම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව අවශ්‍ය මූලික සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරෙන අතර ඉන් වැඩිම ලකුණු ලබා ගන්නා අය සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. මෙමගින් පවතින පුරප්පාඩු වලින් 1/3 ක් සම්පූර්ණ කරනු ලැබේ.

V විභාග සඳහා ඉදිරිපත් වීමේදි අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගුවන් ගමන් බලපත්‍රයක් රැගෙන ආ යුතුය. දෙපාර්තමේන්තු හැඳුනුම්පත භාරගනු නොලැබේ.

VI විභාග විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| බන්ධනාගාර අඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | සියළුම වගන්ති | පැය 02 | 100% | 40% |
| මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | සාමාන්‍ය දැනීම අපේක්ෂා කරයි | පැය 01 | 100% | 40% |

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරට

උසස් කිරීම සඳහා වන විභාගය 2016

විභාග අංකය [ ]

01. නිලධාරියාගේ/ නිලධාරිණියගේ සම්පූර්ණ නම :-

02. මුලකුරු සමඟ අගට යෙදෙන නම :- මයා/මෙය/මිය සඳහන් කරන්න

a. සිංහලෙන්/දෙමලෙන්

b. ඉංග්‍රීසියෙන්

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :- [ ] පුරුෂ -1 , ස්ත්‍රී - 0

04. සේවා ස්ථානය හා ලිපිනය :-

a. සිංහලෙන්/දෙමලෙන්

b. ඉංග්‍රීසියෙන්

05. ස්ථිර තනතුරට පත් වූ දිනය හා පත්වීම ස්ථිර කල දිනය :-

06. සථිර තනතුරේ සේවා කාලය (2016/03/31 දිනට) :-

07. 2016/03/31 වන දිනට පූර්වාසන්න වසර 08 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබේද? :-

08. පූර්වාසන්න වසර 03 තුළ විනයානුකූල දඬුවම් ලබා තිබේද? :-

09. දැනට විනය පරීක්ෂණයකට යටත්ව සිටීද? යන වග :-

10. ජ්‍යෙෂ්ඨත්වය පහත හෙලා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :-

11. කාර්යක්ෂමතා කඩඉම් සමත් වූ දිනය :- I වන කාර්යක්ෂමතා කඩඉම්
II වන කාර්යක්ෂමතා කඩඉම්

(නිදහස් කර ඇත්නම් ඒ බව සඳහන් කල යුතුය)

12. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :- [ ]

(සිංහල - 02, දෙමල - 03, ඉංග්‍රීසි - 04, අදාළ ඉලක්කම කොටුව තුල සඳහන් කරන්න

ඉහත මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය යැයි විභාගය පැවැත්වීමට පෙර හෙලිවුවහොත්, විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම් දිනෙන් පසු අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු වන බවත් හොඳාකාරව දනිමි.

..............................................

දිනය ...................................... අයදුම්කරුගේ අත්සන

## බන්ධනාගාර අධිකාරී නිර්දේශය

..........................................................................................යන අය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ පැමිණීම/ හැසිරීම සතුටුදායක/අසතුටුදායක බවත් .................... දින සිට ස්ථිර නියාමක තනතුරේ සේවය කරන බවත් , විනය පරීක්ෂණයකින් දඬුවම් ලබා ඇති/ නැති බවත්, ඔහුට ඇයට සැරයන් තනතුරට උසස් කිරීමේ විභාගයට පෙනී සිටීමට අවසර දීමට සුදුසුකම් සපුරා ඇති/නැති බවත් සහතික කරමි. අයදුම්පත් නිර්දේශ කරමි/නොකරමි.(නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය පරීක්ෂණ පවතින්නේ නම් හෝ පැවැත්වීමට අදහස් කරන්නේ නම් එම විස්තර වෙනම ඇතුලත් කල යුතුය.)

......................................

දිනය ....................................... බන්ධනාගාර අධිකාරී